ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No .
දිනය / திகதி / Date. 2025.06.11

හෂාන් සංදේශ් අත්තනායක
48/44A,
පොල්වත්ත,
සුදුහුම්පල, මහනුවර.

**පැමිණිලිකාර පාර්ශවය**

විදුහල්පති
මහ/කිංස්වුඩ් විද්‍යාලය,
මහනුවර.

**වගඋත්තරකාර පාර්ශවය**

**<u>පැමිණිලි අංකය : HRC/KND/588/24 - I</u>**

**<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

පැමිණිලිකරු විසින් 2024.10.15 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ පැමිණිල්ල ගොනු කරමින් ප්‍රකාශ කර ඇත්තේ, තම දරුවා වන ලකිඳු විරන්ත අත්තනායක යන අය මහ/කිංස්වුඩ් විද්‍යාලයේ 2025 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය හා සහෝදර ගණය යටතේ අයදුම්පත් දෙකක් යොමු කළ බවත්, එහිදී පදිංචිය තහවුරු කිරීමේ ප්‍රධාන ලේඛනය ලෙස විහාර හා දේවාලගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් සහතික කරන ලද 2024.07.11 දිනැති සහතිකය යොමු කළ බවත් ය.

එහෙත් එම සහතිකය 2024.06.30 දිනයෙන් පසුව ලබා ගෙන තිබීම හේතුවෙන් යොමු අංක CO-176 යටතේ  පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ යොමු කරන ලද අයදුම්පත ප්‍රතික්ෂේප කරන බවට මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් 2024.09.04 දිනැති ලිපිය මගින් දැනුම්දුන් බැවින් එලෙස 2024.06.30 දිනයෙන් පසුව අදාළ සහතිකය නිකුත් කිරීමට හේතු වූ කරුණු පිළිබඳව විදුහල්පතිතුමාට පැහැදිලි කළ බවත්, එම කරුණු පිළිනොගැනීම හේතුවෙන් බෞද්ධ කටයුතු කොමසාරිස්තුමා විසින් අංක බෞකො/විහාදේ/මහ/13/486VI සහ 2024.10.11 දිනැති ලිපිය මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා වෙත යොමු කරමින් 2025 වර්ෂයේ පළමුවන ශ්‍රේණියට දරුවන් ඇතුළත් කිරීම සඳහා විහාර දේවාලගම් පනත යටතේ පදිංචිය තහවුරු කිරීමේ ලිපි 2024.06.30



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

දිනෙන් පසු විශාල ප්‍රමාණයක් ලබාගෙන ඇතත් අනෙකුත් පාසල් වලින් මෙවැනි ගැටලුවක් ඇති වී නොමැති බවට දැනුම් දී තිබුණ ද, පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ සම්මුඛ පරීක්ෂණය සඳහා අවස්ථාව ලබා නොදුන් බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

කෙසේනමුත්, BR-09 යටතේ සහෝදර ගණය යටතේ 2024.10.08 වන දින තමා සම්මුඛ පරීක්ෂණයට කැඳවූ බවත්, එහිදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තමා හට කිසිදු ලකුණක් ලබා නොදී සම්මුඛ පරීක්ෂණයෙන් ඉවත් කරන ලද බවත්, එම නිසා තමා විසින් අභියාචනයක් ඉදිරිපත් කළ බවත්, ඒ අනුව 2024.12.17 වන දින අභියාචන සම්මුඛ පරීක්ෂණය වෙත තමා කැඳවූ නමුත්, පළමු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තමා හට කිසිදු ලකුණක් ලබා දී නොමැති බැවින් ඔවුන් හට තීරණයක් ලබා දිය නොහැකි බව අභියාචන මණ්ඩලය විසින් දැනුම්දුන් බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. තවද, තම අයදුම්පත ප්‍රතික්ෂේප වීමට හේතුව වන බෞද්ධ කටයුතු කොමසාරිස්තුමාගේ ලිපිය අනෙකුත් පාසල් පිළිගන්නා බැවින් තමාහට අසාධාරණයක් සිදු වී ඇති බව අභියාචන මණ්ඩලය විසින් පිළිගත් බවත්, පළමු සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇති ආකාරය පිළිබඳව අභියාචන මණ්ඩලය විසින් දැඩි අප්‍රසාදයක් පළ කළ බවත්, විදුහල්පතිවරයා සමඟ සාකච්ඡා කර තමාහට සාධාරණ තීරණයක් ලබාදෙන බව අභියාචන මණ්ඩලය විසින් ප්‍රකාශ කළ බවත් පැමිණිලිකරු විසින් සිය පැමිණිල්ල තුළින් දක්වා ඇත.

ඒ අනුව 2024.12.18 වන දින පාසලෙන් දුරකථන ඇමතුමක් ලබා දී තමා පාසලට කැඳවා සහෝදර ගණය යටතේ පළමු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සිටි පාසලේ විදුහල්පතිවරයා සහ සහකාර විදුහල්පතිනිය විසින් ලකුණු ලේඛනයක පළමු සම්මුඛ පරීක්ෂණ ලකුණු තීරුවේ ලකුණු 15ක් පමණක් සටහන් කර තමාහට ලබා දුන් බවත්, ඊට අදාළව නැවත අභියාචන මණ්ඩලය වෙත ඉදිරිපත් වීමට අවස්ථාව ලබා නොදුන් බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

තවද, තමා මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු අංශයේ අධ්‍යක්ෂතුමිය දැනුවත් කළ බවත්, තමා හට නැවතත් අභියාචන මණ්ඩලයට ඉදිරිපත් වීමට අවස්ථාවක් ලබාදිය යුතු බව ඇය විසින් ප්‍රකාශ කර සිටි බවත්, ඒ අනුව 2024.12.23 වන දින විෂයභාර අධ්‍යක්ෂතුමිය තමා ඉදිරිපිටදීම මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයාට දුරකථන ඇමතුමක් ලබා ගෙන තමා හට අභියාචන මණ්ඩලයට ඉදිරිපත් වීමට අවස්ථාව දිය යුතු බව දන්වා පාසලට එවිය යුත්තේ කවදාද කුමන වේලාවටද යන්න විමසා සිටි බවත්, එහිදී විදුහල්පතිවරයා විසින් 2024.12.24 වන දින පෙ.ව. 8.00 ත් 8.30 ත් අතර තමා පාසලට එවන ලෙස අධ්‍යක්ෂතුමියට දැනුම් දුන් බව එතුමිය විසින් තමා හට පැවසූ බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

ඒ අනුව තමා 2024.12.24 වන දින පෙ.ව. 8.15ට පමණ පාසලට ගිය බවත්, පාසලේ මුරකරුට තමා පැමිණි කාරණය ප්‍රකාශ කර සිටි නමුත්, මේ පිළිබඳ ඔවුන්ව දැනුවත් කර නොමැති බව ඔහු විසින් පවසා පාසලේ කාර්යාලය වෙත දුරකථන ඇමතුමක් ලබාගත් බවත්, අභියාචන මණ්ඩලය

පැමිණියහොත් තමා ඉදිරිපත් කරන බව පවසා එතෙක් රැඳී සිටින ලෙස දැනුම්දුන් බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

පසුව මුරකරුවෙකු නැවත පැමිණ කාර්යාලයේ දුරකථන අංකය ලබා දී එයින් විමසා සිටින ලෙස තමා හට දැන්වූ බවත්, ඒ අනුව පෙ.ව. 9.05 ට පමණ දුරකථන ඇමතුමක් ලබාගෙන තමා පැමිණි කාරණය කාර්යාලය වෙත දැනුම් දුන් නමුත්, එවැනි කාරණයක් ඔවුන් නොදන්නා බැවින් තොරතුරු විමසා දැනුම් දෙන බවට තමාට ප්‍රකාශ කර සිටි බවත්, එහෙත් ප්‍රතිචාරයක් නොලැබුණු නිසා පෙ.ව. 10.05 ට පමණ නැවතත් දුරකථන ඇමතුමක් ලබාගෙන අභියාචන මණ්ඩලය නොපැමිණෙන්නේ නම් විදුල්පතිතුමාගෙන් වෙනත් දිනයක් හෝ ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලද බවත්, එහිදී දුරකථන ඇමතුම සඳහා සම්බන්ධ වූ නිලධාරිනිය මදක් රැඳී සිටින ලෙස පැවසූ බවත්, ඉන්පසු දුරකථන ඇමතුමට සම්බන්ධ වූ පුද්ගලයෙකු විසින් පාසලට පැමිණෙන ලෙසට දැනුම් දුන්නේ කවුරුන් විසින්දැයි විමසූ බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

එම අවස්ථාවේ දී විෂය භාර අධ්‍යාපන අධ්‍යක්ෂතුමියගේ දැනුම් දීම පරිදි විදුහල්පතිතුමාගේ කැඳවීමට අනුව තමා පැමිණි බව පවසා සිටි බවත්, තමා විසින් අදාළ කාරණය පැවසූ පසු අභියාචන පරීක්ෂණයට කැඳවීම් ලිපි යොමුකර කැඳවා ඇති අය පමණක් අභියාචන මණ්ඩලයට ඉදිරිපත් කළ බැවින් ඉන්පසුව කිසිදු හේතුවක් මත කිසිදු අයෙක් අභියාචන මණ්ඩලයට ඉදිරිපත් කළ නොහැකි බව දුරකථන ඇමතුමට ප්‍රතිචාර දැක්වූ තැනැත්තා විසින් දැනුම් දුන් බවත්, එහෙත් තමා දිගින් දිගටම අධ්‍යාපන අධ්‍යක්ෂතුමියගේ දැනුවත් කිරීම අනුව පැමිණි බව පැවසීමේ දී එකී තැනැත්තා විසින් දුරකථනය විසන්ධි කරන ලද බවත්, තමා හට පිළිතුරක් නොලැබුණු නිසා පාසලෙන් පිටව ආ බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. එසේහෙයින් ඉහත කී කරුණු සලකා බලා තමා හට සාධාරණ තීරණයක් ලබාදෙන ලෙස පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

වගඋත්තරකාර පාර්ශවය වන මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් අංක මහ/කිංස්වුඩ් /04/01/2025 සහ 2024.11.01 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් 2025 වර්ෂයේ පළමු ශ්‍රේණියට සිසුන් ඇතුලත් කිරීමට අදාළව පැමිණිලි පාර්ශවය විසින් "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ළමයින්" සහ "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ගේ සහෝදර සහෝදරියන්" යන ගණ දෙක යටතේ ඉල්ලුම් කර ඇති බවත්, එම ගණ දෙකම සඳහා පදිංචිය තහවුරු කිරීමේ ප්‍රධාන ලේඛනය ලෙස "විහාර හා දේවාලගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බදු ඔප්පු හෝ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් සහතික කරන ලද අදාළ විහාරාධිපති විසින් නිකුත් කරන සහතික" යන විධිවිධානයට අදාළව

බෞද්ධ කටයුතු කොමසාරිස්ගේ 2024.07.11 වන දිනැති ලිපිය පමණක් අයදුම්පත්‍රය සමඟ යොමු කර ඇති බවත් සඳහන් කර ඇත.

එසේම, 2025 වර්ෂයේ පළමුවන ශ්‍රේණිය සඳහා ළමුන් ඇතුළත් කිරීමේ 25/2024 චක්‍රලේඛයේ 17.0 අනුව සුදුසුකම් සලකා බලන අවසාන දිනය 2024.06.30 වන බවත්, එම නිසා ඉහත කී ලිපිය ද 2024.06.30ට පෙර ලබාගෙන තිබීම අත්‍යාවශ්‍ය කරුණක් වන නමුත්, පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද බෞද්ධ කටයුතු කොමසාරිස්ගේ ලිපියෙහි දිනය 2024.07.11 ලෙස සඳහන්ව තිබූ බැවින් පැමිණිලිකරු විසින් ඉල්ලුම් කරන ලද ගණ දෙක සඳහාම ප්‍රතික්ෂේප වී ඇති බවත් වගඋත්තරකාර පාර්ශවය වන මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

තවද, පැමිණිලිකරු විසින් පදිංචිය තහවුරු කරන වෙනත් පිළිගත හැකි ලේඛන ද ඉදිරිපත් කර නොමැති අතර 2024.06.30ට පෙර අඛණ්ඩව බදු ගෙවූ බදු කුවිතාන්සි හෝ මීට පෙර වර්ෂයේ දරුවා පාසලට ඇතුළත් කිරීමේ දී බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස් නිකුත් කළ ලිපිය හෝ ඉල්ලුම්පත්‍රය සමඟ යොමු කර නැති බවත්, 25/2024 චක්‍රලේඛයේ 7.2.1 හි සඳහන් පරිදි ඉල්ලුම් කරන ලද ගණ දෙක සඳහා ඉදිරියට ලකුණු පිරිනැමීමට පදිංචිය තහවුරු වීම අනිවාර්ය වන බවත්, වගඋත්තරකාර පාර්ශවය විසින් 25/2024 චක්‍රලේඛයේ විධිවිධානවලට යටත්ව නිවරදිව කටයුතු කර ඇති බැවින් පැමිණිලිකරු වෙත කිසිදු ආකාරයක අගතියක් සිදු වී නොමැති බවත් වගඋත්තරකාර පාර්ශවය වන මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් සිය වාර්තාව තුළින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**නිරීක්ෂණ**

පැමිණිලිකරු විසින් සිය දරුවා වන ලකිඳු විරන්ත අත්තනායක යන අය 2025 වර්ෂයේ මහ/කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට ඇතුලත් කිරීම සඳහා "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" සහ "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/සහෝදරියන්"යන ගණ දෙක යටතේම අයදුම් කර ඇති බවත්, එහිදී පදිංචිය තහවුරු කිරීමේ ප්‍රධාන ලේඛනය ලෙස විහාර හා දේවාලගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් සහතික කරන ලද 2024.07.11 දිනැති සහතිකය යොමු කර ඇති බවත් නිරීක්ෂණය වේ.

එම අයදුම්පත් අතුරෙන් "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" යන ගණය යටතේ යොමු කරන ලද අයදුම්පතට අදාළව සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණිලිකාර පාර්ශවය නොකැඳවා ඇති බවත්, පැමිණිලිකරු විසින් පදිංචිය තහවුරු කිරීමේ ප්‍රධාන ලේඛනය ලෙස ඉදිරිපත් කර ඇති ඉහත කී විහාර හා දේවාලගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් සහතික කරන ලද 2024.07.11 දිනැති සහතිකය, 2024.06.30 දිනයෙන් පසුව ලබා ගෙන තිබීම හේතුවෙන් යොමු අංක CO-176 යටතේ පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ යොමු කරන ලද අයදුම්පත ප්‍රතික්ෂේප කරන බවට වගඋත්තරකාර පාර්ශවය වන මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් 2024.09.04 දිනැති ලිපිය මගින් පැමිණිලිකරු වෙත දැනුම් දී ඇති බවත් පෙනී යයි.

මෙලෙස ප්‍රතික්ෂේප වීම හේතුවෙන් බෞද්ධ කටයුතු කොමසාරිස්තුමා විසින් අංක බෞකො/විහාදේ/මහ/13/486VI සහ 2024.10.11 දිනැති ලිපිය මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා වෙත යොමු කරමින් 2025 වර්ෂයේ පළමුවන ශ්‍රේණියට දරුවන් ඇතුළත් කිරීම සඳහා විහාර හා දේවාලගම් පනත යටතේ පදිංචිය තහවුරු කිරීමේ ලිපි 2024.06.30 දිනෙන් පසු විශාල ප්‍රමාණයක් ලබාගෙන ඇතත් අනෙකුත් පාසල් වලින් මෙවැනි ගැටලුවක් ඇති වී නොමැති බවට දැනුම් දී ඇති බවත් නිරීක්ෂණය වේ.

තවද, “දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/සහෝදරියන්” යන ගණය යටතේ යොමුකරන ලද අයදුම්පතට අදාළව 2024.10.08 වන දින සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණිලිකරු කැඳවා ඇති බවත්, ඒ අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වුවද, පැමිණිලිකරු විසින් පදිංචිය තහවුරු කිරීමේ ප්‍රධාන ලේඛනය ලෙස ඉදිරිපත් කර ඇති ඉහත කී විහාර හා දේවාලගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් සහතික කරන ලද 2024.07.11 දිනැති සහතිකය, 2024.06.30 දිනයෙන් පසුව ලබාගෙන ඇති බැවින් පදිංචිය සනාථ වී නොමැති බවට සඳහන් කර කිසිදු ලකුණක් ලබා දී නොමැති බවත් නිරීක්ෂණය වේ.

ඊට අදාළ අභියාචනය සලකා බැලීම සඳහා පැමිණිලිකරු 2024.12.17 වන දින මහ/කිංස්වුඩ් විද්‍යාලය වෙත කැඳවා ඇති නමුත්, ඉහත සඳහන් කර ඇති පරිදි පළමු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරු හට කිසිදු ලකුණක් පිරිනමා නොමැති බැවින් අභියාචන මණ්ඩලයට ද ලකුණු ලබා දීමට හැකියාවක් නොමැති බව අභියාචන මණ්ඩලය විසින් පැමිණිලිකරු හට දැනුම් දී ඇති බවත්, ඊට පසු දින එනම්, 2024.12.18 වන දින පැමිණිලිකරු නැවත විද්‍යාලය වෙත කැඳවා ඇති බවත්, එහිදී “දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/සහෝදරියන්” යන ගණය යටතේ යොමුකරන ලද අයදුම්පතට අදාළව ‘දැනට පාසලේ ඉගෙනුම ලබන සහෝදරයින්’ යන නිර්ණායකය සඳහා ලකුණු 10ක් සහ ‘සහෝදරයා පළමු ශ්‍රේණියට ඇතුලත්ව ඉගෙනු ලැබීම’ යන නිර්ණායකය සඳහා ලකුණු 05ක් වශයෙන් ලකුණු 15ක් ලබා දී ඇති බවත්, එහිදී පදිංචිය සම්බන්ධයෙන් හැර අනෙකුත් ලේඛන සඳහා ලකුණු ලබා දී ඇති බවත් නිරීක්ෂණය වේ.

මහ/ කිංස්වුඩ් විද්‍යාලය විසින් බෞද්ධ කටයුතු කොමසාරිස්ගේ ලිපියට ලකුණු ලබා නොදුන්න ද, පැමිණිලිකරු විසින් 2025 වර්ෂයේ තම දරුවා පළමු වසරට ඇතුළත් කිරීම සඳහා මහ/ වාරියපොල ශ්‍රී සුමංගල විද්‍යාලයට යොමු කරන ලද අයදුම්පත අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා එකී පාසල විසින් පැමිණිලිකරු පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනය ලෙස ඉදිරිපත් කරන ලද බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් නිකුත් කරන ලද 2024.07.11 දරණ ලිපිය සඳහා ලකුණු 20ක් ලබා දී ඇති බවත් නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ලට අදාළව 2025.01.28 වන දින කොමිෂන් සභාව හමුවේ පවත්වන ලද පරීක්ෂණයේදී වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත්තේ බෞද්ධ කටයුතු කොමසාරිස්

විසින් පදිංචිය සනාථ කිරීම සඳහා ලබා දෙන ලද ලිපිය 2024.06.30 දිනෙන් පසුව එනම්, 2024.07.11 වන දින නිකුත් කර ඇති බවත්, අංක 25/2024 චක්‍රලේඛයේ 17.0 අනුව සුදුසුකම් සපුරා තිබිය යුතු අවසාන දිනය 2024.06.30 වන බැවින් එදිනට පසුව නිකුත් කරන ලද ලිපි සලකා බැලීම සිදු නොකරන බවත් ය. එහෙත් පැමිණිලිකාර පාර්ශවය විසින් ප්‍රකාශ කරන ලද්දේ තමන් හා සමානව බෞද්ධ කටයුතු කොමසාරිස් භාරයේ ඇති ඉඩම් වල පදිංචි 2024.06.30 දිනෙන් පසු ලිපි නිකුත් කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා ඇති බවත්, ඇතැම් අයදුම්කරුවන්ගේ දරුවන් පාසලට ඇතුලත් කරගෙන ඇති බවත් ය.

ඒ අනුව මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ 2025 වර්ෂයේ පළමු වසරට සිසුන් ඇතුළත් කර ගැනීමට අදාළව බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් ලිපි නිකුත් කරන ලද අයවලුන්ගේ ලේඛනයක් ලබාදෙන ලෙසට කොමිෂන් සභාව විසින් බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා වෙතින් සිදු කළ ඉල්ලීමට අනුව බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් 2025.02.18 වන දිනැති ලිපිය මඟින් මහ/ කිංස්වුඩ් විද්‍යාලයට ඇතුළත් වීම සඳහා විහාර හා දේවාලගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් ලිපි නිකුත් කරන ලද අයදුම්කරුවන් 28 දෙනෙකුගේ ලේඛනයක් යොමු කර ඇත.

එකී ලිපි නිරීක්ෂණයේදී පෙනී යන්නේ අදාළ ලිපි 2024.07.04 දිනෙන් පසුව නිකුත් කර ඇති බවයි. මෙම පැමිණිල්ලට අදාළව 2025.03.18 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී අනාවරණය වී ඇත්තේ ඉහත කී අයදුම්කරුවන් 28 දෙනා අතුරෙන් පස්දෙනෙකු මහ/ කිංස්වුඩ් විද්‍යාලයට ඇතුලත් කරගෙන ඇති බවයි. පහත සඳහන් වගුවෙන් ඒ බව සනාථ වේ.

| යොමු අංකය | අයදුම්කරුගේ නම | බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් ලිපිය නිකුත් කර ඇති දිනය |
|---|---|---|
| CO-114 | යූ.එල්.ජී.එස්. පෙරේරා මයා | 2024.07.05 |
| CO-288 | ඩී. එම්. අයි.පී. දිසානායක මයා | 2024.07.25 |
| CO-289 | ඒ.පී.ආර්.එස්. කරුණාරත්න මයා | 2024.07.04 |
| CO-369 | පී.ජී.එන්. මංජුලා මිය | 2024.07.16 |
| CO-423 | යූ.ජී. හඳපහන්දුන්න මයා | 2024.07.22 |

2025.03.18 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී ඉහත සඳහන් කරුණු පිළිබඳව වගඋත්තරකාර පාර්ශවය වන මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයාගෙන් සිදු කළ විමසීමේදී ඔහු විසින් ප්‍රකාශ කළේ එම තෝරාගත් දරුවන් විසින් බෞද්ධ කටයුතු කොමසාරිස්ගේ ලිපියට අමතරව අඛණ්ඩව බදු ගෙවූ රිසිට්පත් හා බදු ඔප්පු ඉදිරිපත් කර තිබූ බවත්, එකී ලේඛන ද සලකා බලා ලකුණු

ලබා දුන් බවත් ය. තෝරාගත් දරුවන්ගේ ලේඛන නිරීක්ෂණයේදී සියලුම අයදුම්කරුවන් විසින් අඛණ්ඩව බදු ගෙවා ඇති බවක් අනාවරණය නොවේ.

ඉහත කී අංක CO-288 යටතේ අයදුම් කර ඇති ඩී. එම්. අයි. පී. දිසානායක යන අය විසින් ඉදිරිපත් කර ඇති බදු ඔප්පුව අනුව 2011.08.01 වන දින සිට අවුරුදු 20ක් දක්වා අදාළ දේපළ භුක්ති විඳිය හැකි බවත්, ඊට අදාළ බදු මුදල් එක් එක් වර්ෂවල අගෝසතු මස 01ට පෙර ගෙවා නිමකළ යුතු බවත් සඳහන් වුවද, එම කොන්දේසීන් අනුව බදු ගැනුම්කරු කටයුතු කර නොමැති අතර 2012 වසරේ සිට 2016 වසර දක්වා අවුරුදු 05ක් සඳහා එකවර රු.24,000.00ක මුදලක් ගෙවා ඇත්තේ 2024.07.21 වන දින වන බවත්, බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් අදාළ ලිපිය නිකුත් කර ඇත්තේ 2024.07.25 වන දින වන බවත් නිරීක්ෂණය වේ.

කෙසේවෙතත් පැමිණිලිකරු විසින් මහ/කිංස්වුඩ් විද්‍යාලය වෙත ඉදිරිපත් කර ඇති විහාර හා දේවාලගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් සහතික කරන ලද 2024.07.11 දිනැති ලිපියෙහි සඳහන් කර ඇත්තේ පැමිණිලිකරු වාර්ෂික බදු පදනමින් උපන් දා සිට හා විවාහයෙන් පසුවත් මහනුවර, සුදුහුම්පල, පොල්වත්ත, අංක 48/44 ඒ දරණ ලිපිනයේ පදිංචිව සිටින බවයි. ඒ අනුව එකී ලිපිය 2024.07.11 වන දින නිකුත් කර තිබුණ ද, 2024.06.30 දින වන විට පැමිණිලිකරු අදාළ ලිපිනයේ පදිංචිව සිටි බව තහවුරු වන බැවින් වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කරන පරිදි 2024.06.30 දින වන විට පැමිණිලිකරු අදාළ සුදුසුකම් සපුරා නැති බවට වන ප්‍රකාශය පිළිගැනීම ගැටලු සහගත වන බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

තවද, පැමිණිලිකරුගේ වැඩිමහල් දරුවා වන ආර්.වී. අත්තනායක යන අය 2020 වර්ෂයේ දී මහ/ කිංස්වුඩ් විද්‍යාලය වෙත ඇතුළත් කර ඇති අතර, ඒ සඳහා ද පදිංචිය තහවුරු කිරීම සඳහා බෞද්ධ කටයුතු කොමසාරිස්ගේ අංක බෞකො/විහාදේ/මහ/486( ii වෙළුම) සහ 2019.06.27 දිනැති ලිපිය ඉදිරිපත් කර ඇති බවත්, එම ලිපිය සඳහා අභියාචන මණ්ඩලය විසින් ලකුණු 20ක් ලබා දී ඇති බවත් නිරීක්ෂණය වේ. එකී ලිපියෙහි සඳහන් කර ඇත්තේ ද පැමිණිලිකරු වාර්ෂික බදු පදනමින් උපන් දා සිට හා විවාහයෙන් පසුවත් මහනුවර, සුදුහුම්පල, පොල්වත්ත, අංක 48/44 ඒ දරණ ලිපිනයේ පදිංචිව සිටින බවයි. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය වන මහ/කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් පැමිණිලිකරු එකී ලිපිනයෙහි පදිංචිව සිටින බවත්, ඊට අදාළ ලේඛන වැඩිමහල් දරුවා ඇතුළත් කිරීමේ දී ලබා දී ඇති බවත් දැනසිටිය ද ඒ පිළිබඳව සිය අවධානය යොමු කර නැති බව ද නිරීක්ෂණය වේ.

එසේ හෙයින් පැමිණිලිකරු "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" යන ගණය යටතේ යොමු කරන ලද අයදුම්පතට අදාළව ඔහු හට සම්මුඛ පරීකෂණය සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා නොදීම සහ "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/ සිසුවියන්ගේ සහෝදර/ සහෝදරියන්"

යන ගණය යටතේ පැවති සම්මුඛ පරීක්ෂණයේදී නිසි පරිදි ලකුණු ලබා නොදීම යුක්ති සහගත නොවන බවද කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" යන ගණය යටතේ යොමු කරන ලද අයදුම්පත සලකා බැලීමේ දී අංක 25/2024 දරණ චක්‍රලේඛය අනුව පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනය ලෙස "විහාර හා දේවාලගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බදු ඔප්පු හෝ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් සහතික කරන ලද අදාළ විහාරාධිපති විසින් නිකුත් කරන සහතික" යන්න යටතේ ඉදිරිපත් කරන ලද බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් නිකුත් කරන ලද 2024.07.11 දිනැති ලිපිය සඳහා ලකුණු 20ක් ද, පදිංචිය තහවුරු කරන අතිරේක ලේඛන යටතේ පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලිකරුගේ ජාතික හැඳුනුම්පත, පාසල හැරයාමේ සහතිකය, විවාහ සහතිකය, ළමයාගේ උප්පැන්න සහතිකය සහ බැංකු පොත යන ලේඛන සඳහා ලකුණු 5ක් ද, පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය යන්න යටතේ දරුවාගේ මව හා පියා යන දෙදෙනාම 2019, 2020, 2021, 2022 සහ 2023 යන වර්ෂ පහ සඳහාම ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිව සිට ඇති බැවින් ඒ සඳහා ලකුණු 25ක් ද, පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව යටතේ සලකා බැලීමේ දී පැමිණිලිකරුගේ නිවස ආසන්නයේ පිහිටා ඇති මහ/ කිංස්වුඩ් විද්‍යාලයට වඩා ආසන්න පාසල් දෙකක් ඇති බව වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇති අතර එකී පාසල් වන මහ/ රාසිංදෙව් විද්‍යාලය සහ මහ/ මද්දුම බණ්ඩාර විද්‍යාලය සඳහා එක් පාසලකට ලකුණු 05 බැගින් ලකුණු 10ක් අඩු වූ විට ලකුණු 40ක් ද වශයෙන් මුළු ලකුණු 90ක් පැමිණිලිකරු වෙත හිමි විය යුතු බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවය වන  මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් දැනුම් දී ඇති පරිදි පාසලට ආසන්න "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" යන ගණය යටතේ 2025 වර්ෂයේ පළමු වසරට සිසුන් ඇතුළත් කිරීමේ කඩයිම් ලකුණු සීමාව වී ඇත්තේ ලකුණු 78කි. ඒ අනුව එකී ගණය යටතේ සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණිලිකරු කැඳවූයේ නම් ඔහු හට ඉහතින් සඳහන් කළ පරිදි ලකුණු 90ක් හිමිවන බැවින් පැමිණිලිකරුගේ දරුවා අදාළ කඩයිම් ලකුණු සීමාව ඉක්මවා ලකුණු ලබන බැවින් මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" යන ගණය යටතේ ඇතුළත් වීමට සුදුසුකම් ලබන බව කොමිෂන් සභාවට පෙනී යයි.

එසේම, පැමිණිලිකරු විසින් "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/ සහෝදරියන්" යන ගණය යටතේ යොමුකරන ලද අයදුම්පතට අදාළව පැවති සම්මුඛ පරීක්ෂණයේදී 'දැනට පාසලේ ඉගෙනුම ලබන සහෝදරයින්' යන නිර්ණායකය සඳහා ලකුණු 10ක් සහ 'සහෝදරයා පළමු ශ්‍රේණියට ඇතුලත්ව ඉගෙනු ලැබීම' යන නිර්ණායකය සඳහා ලකුණු 05ක් වශයෙන් ලකුණු 15 ක් ලබා දී ඇත. එහෙත් පදිංචිය සම්බන්ධයෙන් වන ලේඛන සඳහා කිසිදු ලකුණක් ලබා දී නොමැත.

අංක 25/2024 දරණ චක්‍රලේඛය අනුව එම ගණය යටතේ පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනය ලෙස "විහාර හා දේවාලගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බදු ඔප්පු හෝ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් සහතික කරන ලද අදාළ විහාරාධිපති විසින් නිකුත් කරන සහතික" යන්න යටතේ ඉදිරිපත් කරන ලද බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද 2024.07.11 දිනැති ලිපිය සඳහා ලකුණු 10ක් ද, පදිංචිය සනාථ කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය යන්න යටතේ දරුවාගේ මව හා පියා යන දෙදෙනාම 2019, 2020, 2021, 2022 සහ 2023 යන වර්ෂ පහ සඳහාම ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිව සිට ඇති බැවින් ඒ සඳහා ලකුණු 20ක් ද, පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව යටතේ සලකා බැලීමේ දී පැමිණිලිකරුගේ නිවස ආසන්නයේ පිහිටා ඇති මහ/ කිංස්වුඩ් විද්‍යාලයට වඩා ආසන්න පාසල් දෙකක් ඇති බව වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇති අතර එකී පාසල් වන මහ/ රාසිංදෙව් විද්‍යාලය සහ මහ/ මද්දුම බණ්ඩාර විද්‍යාලය සඳහා එක් පාසලකට ලකුණු 03 බැගින් ලකුණු 06ක් අඩු වූ විට ලකුණු 24 ක් ද වශයෙන් මුළු ලකුණු 69ක් පැමිණිලිකරු වෙත හිමි විය යුතු බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවය මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් විසින් දැනුම් දී ඇති පරිදි ප "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/සහෝදරියන්" යන ගණය යටතේ 2025 වර්ෂයේ පළමු වසරට සිසුන් ඇතුළත් කිරීමේ කඩයිම් ලකුණු සීමාව වී ඇත්තේ ලකුණු 32කි. ඒ අනුව එකී ගණය යටතේ සම්මුඛ පරීක්ෂණයේදී පැමිණිලිකරු හට නිසි පරිදි ලකුණු ලබා දුන්නේ නම් ඔහු හට ඉහතින් සඳහන් කළ පරිදි ලකුණු 69ක් හිමිවන බැවින් පැමිණිලිකරුගේ දරුවා අදාළ කඩයිම් ලකුණු සීමාව ඉක්මවා ලකුණු ලබන බැවින් මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/සහෝදරියන්" යන ගණය යටතේ ද ඇතුළත් වීමට සුදුසුකම් ලබන බව කොමිෂන් සභාවට පෙනී යයි.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් වශයෙන් ගෙන සලකා බැලීමේ දී පැමිණිලිකරු විසින් සිය දරුවා වන ලකිඳු විරන්ත අත්තනායක යන අය 2025 වර්ෂයේ මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට ඇතුලත් කිරීම සඳහා "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" සහ "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහොදර/සහෝදරියන්"යන ගණ දෙක යටතේම අයදුම් කර ඇති බවත්, එහිදී පදිංචිය තහවුරු කිරීමේ ප්‍රධාන ලේඛනය ලෙස ඉදිරිපත් කර ඇති විහාර හා දේවාලගම් පනත යටතේ බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් සහතික කරන ලද 2024.07.11 දිනැති සහතිකයෙහි පැමිණිලිකරු වාර්ෂික බදු පදනමින් උපන් දා සිට හා විවාහයෙන් පසුවත් අදාළ ලිපිනයේ පදිංචිව සිටින බව සඳහන් කර ඇති බවත් නිරීක්ෂණය වේ.

ඒ අනුව 2024.06.30 දින වන විට පැමිණිලිකරු අදාළ ලිපිනයේ පදිංචිව සිටි බව තහවුරු වී තිබුණද, වගඋත්තරකාර පාර්ශවය විසින් එකී ලිපිය 2024.07.11 වන දින නිකුත් කර තිබීම හේතුවෙන්

2024.06.30 දින වන විට පැමිණිලිකරු අදාළ සුදුසුකම් සපුරා නැති බවට සඳහන් කරමින් "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" යන ගණය යටතේ යොමු කරන ලද අයදුම්පත සම්මුඛ පරීක්ෂණය සඳහා නොකැඳවා ප්‍රතික්ෂේප කිරීම තුළින් හා "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහෝදර/සහෝදරියන්"යන ගණය යටතේ යොමු කරන ලද අයදුම්පතට අදාළව පැවති සම්මුඛ පරීක්ෂණයේදී නිසි පරිදි ලකුණු ලබා නොදීම තුළින් පැමිණිලිකරු හට තම දරුවා මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ පළමු වසරට ඇතුලත් කිරීම සඳහා අවකාශය අහිමි වී ඇති බව තහවුරු වේ.

එසේම, ඉහතින් දැක්වූ පරිදි "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන්" යන ගණය යටතේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබුවේ නම් පැමිණිලිකරු හට ලකුණු 90ක් සහ "දැනටමත් අදාළ පාසලේ අධ්‍යාපනය ලබන සිසු/සිසුවියන්ගේ සහෝදර/සහෝදරියන්"යන ගණය යටතේ පැවති සම්මුඛ පරීක්ෂණයේදී නිසි පරිදි ලකුණු ලබා දුන්නේ නම් ලකුණු 69ක් හිමි වන බව නිරීක්ෂණය වන බැවින් සහ එකී ලකුණු ප්‍රමාණයන් එම ගණ දෙක යටතේම අදාළ කරගත් කඩයිම් ලකුණු සීමාවන් ඉක්මවා යන බව නිරීක්ෂණය වන බැවින් අදාළ සුදුසුකම් සපුරා තිබියදී එම සුදුසුකම්, ගණ දෙකෙන් එකක් යටතේ හෝ නිසි පරිදි සලකා නොබැලීම තුළින් වගඋත්තරකාර පාර්ශවය වන මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව තුළින් සුරක්ෂිත නීතිය පසිඳලීම, ක්‍රියාත්මක කිරීම සහ නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතුය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය සිදු කර සිටී.**

පැමිණිලිකරුගේ දරුවා වන ලකිඳු විරන්ත අත්තනායක යන අය මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමට වගඋත්තරකාර පාර්ශවය වන මහ/ කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් කටයුතු කළ යුතු ය.

2025. 07 . 15 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය

යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),

සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී .පුංචිහේවා,

කොමසාරිස්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. - අවශ්‍ය පියවර ගැනීම සඳහා

03. අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්)
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා